**රාජාංගනය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 21 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 16 දින විගණනයට ඉදිරිපත් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**------------------------**

**(අ)** මූල්‍ය ප්‍රකාශන වල අතැති තොග ලෙස තිබුණු විෂයයන් 03 කට අදාල එකතුව රු.705,981 ක්වූ තොග සභාව සතුව භෞතිකව නොපැවතුණි.මේ සඳහා ගිණුම්වල ප්‍රතිපාදන ඇති කිරීමට හෝ ගිණුම් සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු ණය මුදලින් 2014 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතු රු.385,062 ක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඇති යන්ත්‍රෝපකරණවල වටිනාකම උපලේඛනයේ දැක්වෙන වටිනාකමට වඩා රු.177,800 ක් වැඩියෙන් පෙන්වා තිබුණි.

**1.3.2 නොසැසඳු ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ගිණුම් විෂයයන් 06 ක ශේෂයන් හා උපයෝගි ලේඛන අනුව ශේෂයන් අතර රු.94,859,737 ක වෙනසක් පැවතුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

එකතුව රු.13,280,648 ක් වූ වත්කම් විෂයයන් 02 ක් සම්බන්ධයෙන් අයිතිය සනාථ කිරීමේ ලියවිලි/ස්ථාවර වත්කම් ලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් ඌණතාවය රු.1,150,044 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ඌණතාවය රු.1,295,455 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

------------------------------

**(අ)** විමධ්‍යගත ප්‍රතිපාදන මගින් ප්‍රදේශයේ තෝරාගත් අඩු ආදායම්ලාභී ළමුන්ට බෙදාදීම සඳහා පොත් ලබාගැනීම වෙනුවෙන් සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකු විසින් රු.99,785 ක් වැයකර තිබුණද, එම පාසැල් පොත් බෙදා දුන් ආකාරය හා ප්‍රතිලාභීන් තෝරා ගැනීම පිළිබඳව කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

**(ආ)** ගිණුම් විෂයයන් 2 කට අදාල ලැබිය යුතු එකතුව රු.1,904,931 ක් සහ ගිණුම් විෂයයන් 4 කට අදාල ගෙවිය යුතු එකතුව රු.1,279,016 ක්වූ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ)** 1994 අගෝස්තු 14 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/9/7/19 (i) චක්‍රලේඛය ප්‍රකාරව වසර 05 කට වරක්වත් ප්‍රධාන තක්සේරුවකු ලවා කඩකුලී තක්සේරු කළයුතු වුවත් වසර 20 කට පෙර කරන ලද තක්සේරුව පදනම් කරගෙන කඩ කුලී අයකර තිබුණි.

**(ඈ)** ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව රු.1,406,781 ක්වූ වර්ෂ 2 කට වැඩි කාලයක් ඉක්මවූ හිමිකම් නොපෑ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ)** 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයට අනුව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 93 (අ), (ආ) හා (ඇ) වගන්ති වලට පටහැනිව සභා බල ප්‍රදේශය තුල මලාපවහනය සහ කසල ශෝධනය සම්බන්ධයෙන් සභාව විසින් කටයුතු කර නොතිබුණු අතර සභා බල ප්‍රදේශය තුල පවතින සතිපොල තුනෙහි පමණක් කසල එකතු කර බැහැර කරන බව අනාවරණය විය.

**04. පද්ධති හා පාලනය**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය

**(ඇ)** වත්කම් කළමනාකරණය

**(ඈ)** ණයගැති හා ණයහිමි පාලනය